# කතෝලික චින්තනය වෙනුවට වෙනත් චින්තනයක් බිහිවීම

පෙරදිග උපත ලැබූ දැනුම මුස්ලිම් සංස්කෘතියට අවශෝෂණය කරගත හැකි වීමටත් කතෝලික සංස්කෘතියට අවශෝෂණය කරගත නොහැකි වීමටත් හේතු කවරේද යන්න සොයා බැලිය යුතු ය. අප කලින් සඳහන් කෙළේ බටහිරයන් ඇරිස්ටෝටලීය න්‍යායෙහි සිරකරුවන් වීම එයට හේතුවක් වියහැකි බව ය. කතෝලික සංස්කෘතියෙහි ඇත්තේ ත්‍රිකෝටික න්‍යායකි. ක්‍රිස්තුස් වහන්සේ එක්වර දෙවියන් වහන්සේත් දෙවියන් වහන්සේගේ පුතාත් වන්නේ එලෙස ය. මෙය පාණ්ඩුරා වාදයෙහි දී බෞද්ධ පක්ෂය විසින් කතෝලික (ක්‍රිස්තියානි) ආගමට එරෙහිව ගෙන එන ලද තර්කයකට පදනම් විය. එකම තැනැත්තා පියා ද පුතා ද වන්නේ කෙසේ දැයි විවාදයෙහි දී බෞද්ධයන් විසින් අසනු ලැබ ඇත.

එහෙත් ඒ තර්කය වලංගු වන්නේ ද්විකෝටික න්‍යායෙහි ය. එකල තර්කයකට පදනම් වන න්‍යාය කුමක් දැයි කිසිවකු විසින්වත් සොයා බලනු ලැබිනි යැයි කිවහැකි නො වේ. අද පවා එවැනි දේ ගැන උනන්දුවක් දක්වන්නෝ විරල වෙති. ඒ කෙසේ වෙතත් යුදෙව් චින්තනයේ ද්විකෝටික න්‍යායෙන් කැඩීමට කතෝලිකයෝ සමත්වූහ. එහෙත් උගත් කතෝලිකයන්ට ඒ එතරම් රුචි නොවී ය. ඔවුහු ඇරිස්ටෝටලීය ද්විකෝටික න්‍යායෙහි ම එල්බගෙන සිටියෝ ය. තෝමස් ඇක්වයිනාස් නම් කතෝලික පූජකවරයා වෑයම් කර ඇත්තේ කතෝලික චින්තනය හා ඇරිස්ටෝටලීය න්‍යාය එක්කිරීමට බව පෙනී යයි.

අවාසනාවකට යම් සංස්කෘතියක පිළිගැනෙන දැනුම් නිර්මාණය කෙරෙන්නේ ඒ සංස්කෘතියෙහි බුද්ධිමතුන් යැයි පිළිගැනෙන්නන් විසිනි. කතෝලික සංස්කෘතියෙහි සාමාන්‍ය ජනයාට ත්‍රිකෝටික න්‍යාය ප්‍රශ්නයක් නොවන්නට ඇත. එහෙත් එහි බුද්ධිමතුන්ට ඒ ප්‍රශ්නයක් වන්නට ඇත. ද්විකෝටික න්‍යායෙහි කොටුවුණු බුද්ධිමතුන්ට තමන්ට මුස්ලිමුන් ඔස්සේ ආසියාවෙන් ලැබුණු දැනුම අවශෝෂණය කිරීම ප්‍රශ්නයක් වන්නට ඇත. එහෙත් එයට ද වඩා මූලික කරුණක් දැනුම අවශෝෂණයෙහි දී බලපා ඇතැයි සිතාගත හැකි ය.

කතෝලික සංස්කෘතිය හා මුස්ලිම් සංස්කෘතිය යන දෙකම යුදෙව් සංස්කෘතියට වඩා සංයුක්ත වූ නමුත් මුස්ලිම් සංස්කෘතිය කතෝලික සංස්කෘතියට වඩා වියුක්ත වෙයි. කතෝලික සංස්කෘතියෙහි දෙවියන් වහන්සේ ක්‍රිස්තුස් වහන්සේ ඔස්සේ සංයුක්ත කෙරිණි. එමෙන් ම ක්‍රිස්තුස් වහන්සේ සංයුක්ත ශාස්තෘන් වහන්සේ කෙනෙක් ද විය. මුස්ලිම් සංස්කෘතියෙහි ද මහමත්තුමා අනාගතවක්තෘන් කෙනකුට වඩා ශාස්තෘන් වහන්සේ කෙනකු වුව ද එතුමා සංයුක්ත ශාස්තෘන් වහන්සේ කෙනකු වුව ද අල්ලා දෙවියන් වහන්සේ වියුක්ත වූහ. වෙනත් වචනවලින් කිවහොත් කතෝලික සංස්කෘතියෙහි දෙවියන් වහන්සේ සංයුක්ත වුව ද මුස්ලිම් සංස්කෘතියෙහි අල්ලා දෙවියන් වහන්සේ වියුක්ත දෙවි කෙනෙක් වූහ.

මේ වියුක්ත බව භාරතයෙහි පැන නැගුණු දැනුම අවශෝෂණය කිරීමෙහි ලා මුස්ලිම් සංස්කෘතියට ආධාර විය. භාරතයෙහි දැනුමෙහි ද යම් වියුක්ත බවක් විය. ඒ යුදෙව් සංස්කෘතියෙහි වියුක්ත බව තරම් නොවුණ ද අනෙක් බොහෝ සංස්කෘතීන්ට වඩා වියුක්ත විය. භාරතීය බ්‍රාහ්මණයෝ වියුක්තව සිතීමෙහි දක්ෂයෝ වූහ. භාරතීය ගණිතය හා විද්‍යාව බටහිර ගණිතය හා විද්‍යාව තරම් වියුක්ත නොවුණ ද සිංහල හා වෙනත් බොහෝ විද්‍යාවන්ට වඩා වියුක්ත විය. සිංහලයන් අතර බ්‍රාහ්මණයන්ගේ බලපෑම අඩු විය. සිංහලයන් බෞද්ධයන් වූ පසු බ්‍රාහ්මණ බලපෑම නැත්තට ම මෙන් නැතිවි ය.

කතෝලික සංස්කෘතිය හා චින්තනය සංයුක්ත වූ බැවින් මුස්ලිම් ජනයා ඔස්සේ භාරතයෙන් පැමිණි දැනුම අවශෝෂණය කිරීමෙහි ලා ඒ අසමත් විය. ගැලීලියෝ ගැලීලි භාරතයෙන් කොපර්නිකස් ලබාගත් සූර්ය කේන්ද්‍රවාදය ප්‍රචාරය කිරීමට යැමේ දී පාප් වහන්සේගේ අභියෝගය ඉදිරියේ අසරණ විය. පාප් වහන්සේ ඔහුට කියා සිටියේ පොළොව ඉර වටේ යන බව පෙන්වන ලෙස ය. පාප් වහන්සේට වුයේ සංයුක්ත චින්තනයකි. ඉන්ද්‍රිය ගෝචර නොවන දෙයක් පිළිගැනීමට එතුමා අකමැති විය. මෙරට කිසිවකු ඉර පොළොව වටා යනු දැක නැත. එකල විසූ පාප් වහන්සේ අපට වඩා එඩිතර වී යැයි මම සිතමි. අද අප කිසිම ඉන්ද්‍රිය ගෝචර අත්දැකීමකින් තොරව පොළොව ඉර වටා යන

© Prof. Nalin De Silva

බව පිළිගන්නා නමුත් පාප් වහන්සේ එසේ නොවූහ. එතුමා ගැලීලියෝට තම මතය අස්කර ගැනීමට කියා නො සිටියේ ය. එතුමා කියා සිටියේ ගැලීලියෝ එම මතය උගන්වන්නේ නම් පළමුව ඒ එසේ යැයි පෙන්වා දිය යුතු බව ය.

ගැලීලියෝට සංයුක්ත ව පොළොව ඉර වටා යන බව පෙන්වීමේ හැකියාවක් නො වී ය. භාරතීයයන් මෙන් අභිඥා ආධාරයෙන් එසේ කිරීමට ද ඔහුට නො හැකි විය. ඉතාලියේ එවකට පැවති ප්‍රවණතාව, එනම් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ පැතිර යෑම, අනුව ඔහු වියුක්ත මගක් ගත්තේ ය. ඔහු සාපේක්ෂ නොවන චලිතය නිරීක්ෂණය කළ නොහැකි බව පෙන්වා දුන්නේ ය. ඔහු කියා සිටියේ නිරීක්ෂකයා ද පොළොව සමග චලනය වන බැවින් පොළොවේ චලිතය නිරීක්ෂකයාට නිරීක්ෂණය කළ නොහැකි බව ය. අපට නිරීක්ෂණය කළ නොහැකි දෑ ද ඇති බව ඔහු එමගින් කියා සිටියේ ය. එහෙත් ඔහු පෙන්වා දුන්නේ සාපේක්ෂ නොවන චලිතය නිරීක්ෂණය කළ නොහැකි බව මිස නිරීක්ෂණය කළ නොහැකි සෑම දෙයක් ම පවතින බව නො වේ. ගැලීලියෝට පොළොව ඉර වටා යන බව පෙන්වා දීමට නො හැකි විය. එහෙත් ඔහු ග්‍රීකයන්ගෙන් පසුව වියුක්ත ව සිතීමට යුරෝපයට ඉගැන්වී ය.

බටහිරයන්ට භාරතීය දැනුම අවශෝෂණය කිරීමට හැකිවූයේ එලෙස වියුක්තව සිතීමෙන් පමණකි. මෙයට අමතරව ගැලීලියෝ වෙන්කිරීම ද ඉගැන්වී ය. ප්‍රක්ෂෙපණය කරන ලද වස්තුවක චලිතය සාකච්ඡා කිරීමේ දී එහි චලිතය සිරස් හා තිරස් යනුවෙන් සංරචක දෙකකට වෙන්කළ හැකි බවත් ඒ චලිත සංරචක එකිනෙකින් ස්වායත්ත ව ගත හැකි බවත් පෙන්වා දුන්නේ ගැලීලියෝ ය. එලෙස ගත්කල ගැලීලියෝ බටහිර විද්‍යාවේ පියා ලෙස හැඳින්විය හැකි ය. එහෙත් ඔහු බටහිරයන් කියන අන්දමට ඊනියා පරයේෂණාත්මක ක්‍රමයක  පියා නො වී ය.

කතෝලික චින්තනයෙහි මුස්ලිම් චින්තනයෙහි තරමටවත් වියුක්ත බවක් නොතිබූ බැවින් බටහිරයන්ට භාරතීය දැනුම අවශෝෂණය කිරීමේ දී වියුක්තය මුළුමනින් ම මෙන් ලබාගැනීමට සිදුවිය. එහි ප්‍රතිඵලය වූයේ බටහිරයන් යුදෙව් චින්තනයේ වූ වියුක්තය මුළුමනින් ම මෙන් තම චින්තනයට ඇතුළත් කර ගැනීම ය. ගැලිලියෝට පෙර බටහිරයන් ලබාගත් වෙන්කිරීමත්, පෞද්ගලිකත්වයට හා ඉන්ද්‍රිය පිනවීමට ඉඩදීමත්, පසුව ග්‍රීකයන්ගෙන් ලබාගත් ස්වසිද්ධාත්මක ක්‍රමයත් ආදිය හේතුකොටගෙන බටහිර චින්තනය කතෝලික චින්තනයෙන් අද අප ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය යනුවෙන් හඳුන්වන චින්තනයට මාරු විය. එය චින්තන විප්ලවයක් විය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වය යනු මේ චින්තන විප්ලවයෙන් බිහි වූ සමාජයීය තත්වය ය. එහි ආරම්භය පහළොස්වැනි සියවසට යයි. ඒ විප්ලවය එක් දවසකින් හෝ වසරකින් සිදුවූවක් නො වේ. එයට සියවස් ගණනාවක් ම ගතවිය. ඒ විකාශයෙහි තවමත් අවසානයක් දක්නට නැත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය තවමත් විකාශය වෙමින් පවතියි. වෙන් කිරීම අද වඩා වේගයකින් කෙරී ගෙන යයි. අද පුද්ගලයා අනෙක් පුද්හකලයන්ගෙන්, ඉඩම් වලින් හා ස්වභාව ධර්මයෙන් පමණක් නොව තමන්ගෙන් ද වෙන්වීමට පටන්ගෙන ඇත.

බටහිර බිහි වූ මේ ග්‍රීක යුදෙව්  ක්‍රිස්තියානි චින්තනය හා යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය මගින් කතෝලික නොවන ක්‍රිස්තියානි  ආගම් බිහි කෙරිණි. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය වෙන්කිරීමෙහි පරතෙරට හමන්කර ඇත. යුදෙව් චින්තනයෙහි හා යුදෙව් සංස්කෘතියෙහි ආගම සංස්කෘතියෙන් වෙන් කෙරිණි. යුදෙව් ආගමිකයන් නොවූ අයට ද යුදෙව්වෝ තම සංස්කෘතිය පැටවූහ. නිවැරදිව ප්‍රකාශ කරන්නේ නම් යුදෙව් ආගමිකයකු වීම, එනම් යුදෙව්වකු වීම උපතින් සිදු වූවකි. යුදෙව් පවුලකින් පිටත ඉපදුනු අයකුට යුදෙව්වකු වීමට නොහැකි විය. එසේ වුවත් එවැන්නන්ට වුව ද යුදෙව් සංස්කෘතිය වැළඳ ගැනීමේ බාධාවක් නො විණි.

කලින් දක්වා ඇති පරිදි යුදෙව්වෝ හැකිනම් බලහත්කාරයෙන් යුදෙව්වන් නොවන්නන් මත යුදෙව් සංස්කෘතිය පැටවූහ. එහෙත් මුස්ලිම් සංස්කෘතිය හා කතෝලික සංස්කෘතිය එසේ නො වී ය. ඒ සංස්කෘතීන්හි චින්තනවලට සංස්කෘතිය හා ආගම වෙන්කර ගැනීමට නො හැකි විය. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය අනෙක් බොහෝ කරුණුවලදී මෙන් ම මෙහිදී ද යුදෙව් චින්තනයෙන් ආභාසය ලබා යුදෙව්වන් ගිය දුරට ද වඩා දුර ගියේ ය. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ආගම හා සංස්කෘතිය පැහැදිලිව ම වෙන්කරනු ලැබිණි.

© Prof. Nalin De Silva

බටහිරයන් තම සංස්කෘතිය ලෝ පුරා පතුරවන්නේ ආගම ප්‍රචාරය කරමින් ම නොවේ. මේ කරුණ අපට ලංකාවේ ඉතිහාසයෙන් වුව ද හැදෑරිය හැකි ය. පෘතුගීසීහු ලංකාවට පැමිණ තම ආගම, එනම් කතෝලික ආගම ව්‍යාප්තකිරීමට උත්සාහ ගත්හ. එමගින් ඔවුන්ගේ සංස්කෘතිය ද මෙරට ප්‍රචලිත කිරීම ඔවුන්ගේ අභිලාෂය විය. එහෙත් පෘතුගීසීන් ආගමින් කතෝලික වුව ද දහසයවැනි සියවස වන විට ඔවුන්ට ද ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය යම් පමණකට බලපා තිබුණි. එබැවින් ඔවුහු ද ආගමින් තොරව වුව ද සංස්කෘතිය ප්‍රචාරය වීමට විරුද්ධ නොවූහ. ඒ කෙසේ වෙතත් පෘතුගීසීන්ට සියළු වධ හිංසා මධ්‍යයේ ද එතරම් පිරිසක් කතෝලික ආගමට හරවාගත නො හැකි විය.

ලංකාවේ කතෝලික ආගමට විශාල පිරිසක් ඇදී ගියේ සිංහල රජවරුන්ගේ ආශිර්වාදය ලත් ජුසේ වාස් පියතුමන්ගේ ආගමික ප්‍රචාරක කටයුතුවල ප්‍රතිඵලයක් ලෙස ය. කතෝලික සංස්කෘතිය පෙරදිග සංස්කෘතීන්ගෙන් එතරම් වෙනස් නො වෙයි. ජුසේ වාස් පියතුමා භාරතයෙන් පැමිණියෙකි. එතුමා සිංහල රජුගේ ද හිත දිනා ගත්තේ ය. එතුමාට මේ කරුණු හේතුවෙන් පෘතුගීසීන් සමීප වුවාට වඩා ජනතාවට සමීප වීමට හැකිවිය. මෙරට පෘතුගීසි කාලයේ දීට වඩා වැඩි පිරිසක් ලන්දේසීන් සිටි සමයෙහි ජුසේ වාස් පියතුමාගේ ප්‍රචාරක කටයුවල ප්‍රතිඵලයක් ලෙස කතෝලික ආගම වැළඳ ගත්තේ එබැවින් ය.

එහෙත් ජුසේ වාස් පියතුමා වුව ද සිංහල බෞද්ධයනට ඇල්මක් නො දැක්වීය. තම ආගම ප්‍රචාරය කිරීමේ දී තමන්ට සහන සැලසූ තමන්ට රැකවරණය දුන් සිංහල භික්ෂූන් වහන්සේට විරුද්ධව එතුමා ක්‍රියා කළ බවට වාර්තා වෙයි. කන්න දුන් අත සපා කෑමක් වූ එවැනි ක්‍රියා මෙරට බුදුසසුන පිහිටුවීමේ දී හා ප්‍රචාරය වීමේ දී සිදු වී නැති බව අමුතුවෙන් කිවයුතු නො වේ. ලන්දේසීන් හා බ්‍රිතාන්‍යයන් ද තම ආගම ප්‍රචාරය කිරීමට කටයුතු කළ මුත් ඔවුන්ට වඩා වැදගත් වූයේ තම සංස්කෘතීන් අප මත බලයෙන් හෝ විවිධ උපක්‍රම මගින් හෝ පැටවීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva